# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2253/20 - 2021 නොවැම්බර් මස 10 වැනි බදාදා - 2021.11.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ තලවකැලේ ලිඳුල නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අහෝසි වීම හේතුකොට ගෙන තලවකැලේ ලිඳුල නගර සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 අ(1)(අ) වගන්තිය යටතේ තලවකැලේ ලිඳුල නගර සභාවේ අංක 03 තලවකැලේ දකුණ කොට්ඨාසයට තේරී පත්වූ මයිල්වාගනම් පරමනාදන් අයත් වන්නාවූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂය නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම තලවකැලේ ලිඳුල නගර සභාවේ අංක 03 තලවකැලේ දකුණ කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා ඔරුකඳ ලියනගේ අසංක සම්පත් පීරිස් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

තලවකැලේ ලිඳුල නගර සභාවේ තේරීම්භාර නිලධාරී කලුගම්පිටිය අප්පුහාමිලාගේ ලහිරු ශානක කලුගම්පිටිය වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ(1)(අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් ඔරුකඳ ලියනගේ අසංක සම්පත් පීරිස්, තලවකැලේ ලිඳුල නගර සභාවේ අංක 03 - තලවකැලේ දකුණ කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

**කලුගම්පිටිය අප්පුහාමිලාගේ**
**ලහිරු ශානක කලුගම්පිටිය,**
තේරීම්භාර නිලධාරී,
තලවකැලේ ලිඳුල නගර සභාව.

2021 නොවැම්බර් මස 08 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
නුවරඑළිය.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - G 35311 — 20 (2021/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*